**අන්තර් ජාලය**

# ජාල ක්‍රියාකාරකම් විමසුම




තම ව්‍යාපාර හා තොරතුරු අවශ්‍යතාවන් උදෙසා ජාලය තුළට ඇතුළුවී ග්‍රාහකයකු හෙවත් end user කෙනෙකු ලෙස කටයුතු කිරීම සහ ජාලය තුළට පියමං කොට තම වෙබ් අඩවිය පිහිටුවා අන්තර්ජාලය තුළ ස්ථානගතවීම යන දෙයාකාරයට ආයතනික ජාල පරිහරණය සිදුවන බව පසුගිය කලාපයෙන් අපි කියවූයෙමු.

ජාල ක්‍රියාකාරකම්වල ආයතනික මට්ටමේ වර්ධන ශීඝ්‍රතාව මැද මට්ටමක හෙවත් යහපත් මට්ටමක තැන්පත්ව සිටින බව සැබෑවකි. එහෙත් ජාල තාක්ෂණයේ අති ධාවනකාරී වර්ධනයට සමාන්තරව ආයතනික මට්ටමේ ජාල ක්‍රියාකාරකම්වල වර්ධනයක් වේද යන්න විමර්ශනය කළ යුතු කාරණයකි.

ආයතනික ජාල ක්‍රියාකාරකම්වල වපසරිය අතිශයින්ම විශාල එකකි. මෙහිදී මාධ්‍ය කටයුතු සම්බන්ධයෙන් පමණක් ගත් කල වුවද එය විශාල ක්ෂේත්‍රයක් පුරා පැතිර පවතී.

ලාංකීය වශයෙන් අප සලකා බැලිය යුත්තේ අන්තර්ජාල මාධ්‍ය කටයුතු සම්බන්ධයෙන් සමස්ත වපසරිය පුරා අප ගමන් කොට ඇත්ද යන්න සහ දැනට ගමන් කොට ඇති ඉඩහසර තුළ ශක්තිමත්ව ස්ථානගතව ඇත්ද යන ප්‍රධාන කරුණු දෙකයි.

අන්තර්ජාල මාධ්‍ය කටයුතු සම්බන්ධ සමස්ත වපසරිය අපට ග්‍රහණය කර ගැනීමට හැකිවී ඇත්නම් සහ ඒ ඒ ක්ෂේත්‍රයන්හි අපගේ ජාල ක්‍රියාකාරකම් ශක්තිමත්ව මුල් බැස ඇත්නම්, අන්තර්ජාලයේ ශක්ති ධාරිතාවන් අප ප්‍රශස්ත ලෙස භාවිත කරන බවට තෘප්තිමත් විය හැක.

එහෙත් සැබැවින්ම තත්ත්වය එසේම වේද? අනෙක් අතට ඒ සම්බන්ධව නිවැරදි විනිශ්චයක් කරන්නට තරම් අප දැනුවත් භාවයක් අත්පත් කරගෙන ඇත්තෙමු ද? එනම් අදාළ විෂය ක්ෂේත්‍ර අපි හඳුනන්නෙමු ද? එමෙන් ම ලාංකීය මට්ටමේ සිදුවන ජාල ක්‍රියාකාරකම් ජගත් මට්ටමේ ක්‍රියාකාරකම් හා සංසන්දනාත්මක විමර්ශනයකට ලක් කරන්නට අපගේ දැනුවත්භාවය ප්‍රමාණවත් වේද?

මෙම සංසන්දනාත්මක විමර්ශනය වුව ක්ෂේත්‍ර දෙකක් ඔස්සේ කළ යුතුවෙයි. එනම් ජාල ක්‍රියාකාරකම් රඳා පවත්නා තාක්ෂණ කටයුතුවල වර්ධනය තාක්ෂණමය විමසුමකට ලක් කළ යුතු වන අතර ජාල ක්‍රියාකාරකම් මතින් ජනිත වන මාධ්‍ය කටයුතු මාධ්‍යමය විමසුමකට ලක් කළ යුතු වෙයි. එලෙස සංසන්දනාත්මක විමසුමක් සාර්ථකව කිරීමට නම් ජාල තාක්ෂණ දැනුම හා ජාල මාධ්‍යමය දැනුම ඉහළ තලයකට ළඟා කර ගැනීම අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත් වෙයි.

*ලාංකීය වශයෙන් අප සලකා බැලිය යුත්තේ අන්තර්ජාල මාධ්‍ය කටයුතු සම්බන්ධයෙන් සමස්ත වපසරිය පුරා අප ගමන් කොට ඇත්ද යන්න සහ දැනට ගමන් කොට ඇති ඉඩහසර තුළ ශක්තිමත්ව ස්ථානගතව ඇත්ද යන ප්‍රධාන කරුණු දෙකයි.*

එම දැනුම අප සතුව ඇත්ද? දැනුමෙහි දරිද්‍රතාවයෙන් අපි නොපෙළෙන්නෙමෝද?

අන්තර්ජාලයේ භාවිත වන ප්‍රචලිත භාෂාව ඉංග්‍රීසියයි. අනෙකුත් භාෂා ද විශාල සංඛ්‍යාවක් භාවිත වුවද ඒවා පරිහරණය වන්නේ ප්‍රතිශතාත්මක වශයෙන් ඉතාමත් අඩු අගයකිනි. එම නිසා භාවිත වන ප්‍රධාන සහ එකම භාෂාව ඉංග්‍රීසිය යැයි කිවත් එහි වරදක් දැකිය නොහැකි තරම් ය.

එනිසා අපගේ විමර්ශන කටයුතු සියල්ල ඉංග්‍රීසිය මාධ්‍යය කරගෙන කළ යුතු වෙයි. මෙය සාර්ථකව සිදුවනු ඇති ද? ලංකාවේ පමණක් නොව ආසියාතික අනෙකුත් රටවල පවා මව් භාෂාවෙන් මාධ්‍යය හසුරුවන පුවත්පත් කලාවේදීන්ගේ සංඛ්‍යාවට සාපේක්ෂව ඉංග්‍රීසියෙන් කටයුතු කරන පුවත්පත් කලාවේදීන් සිටින්නේ අතලොස්සකි. මව් භාෂාවෙන් හරඹ කරන බහුතරය ජාල ක්‍රියාකාරකම් වෙත යොමු වීමට ඇලි මැලි වෙති. මෙය යම් ශෝචනීය තත්ත්වයක් වුවද එය යථාර්ථයකි. මෙම භාෂාමය බාධකය අපගේ දෛනික බොහෝ කරුණු වලදී මෙන්ම ජාල කටයුතුවලදී ද අප වෙත දත් විලිස්සාගෙන බලා සිටී.

එබැවින් මෙයද ජයගත යුතු තවත් එක් කඩුල්ලක් බවට පත්වෙයි. මෙලෙසින් බලන කල ජාල කටයුතු විමර්ශනය ගැටලු රැසක් මධ්‍යයේ කළ යුතු එකක් බවට පත්වෙයි. අපි කරුණු එකින් එක නිරවුල් කර ගනිමු.

අන්තර්ජාලයේ ශක්ති ධාරිතාවන් අප ප්‍රශස්ත ලෙස භාවිත කරන්නේ ද යන්න විමසීමට නම්...

පළමුව ශක්ති ධාරිතාවන් අප හඳුනාගත යුතු ය. තොරතුරු ලබා ගැනීමට ග්‍රාහකයා සතු අධිකාරවාදී බලය, ක්ෂණික ප්‍රතිචාර දීමේ හැකියාව, ලෝකයේ කවර අන්තයන් වෙත හෝ ක්ෂණිකව ගමන් කිරීමේ හැකියාව, කවර විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් වුව ගබඩා කොට ඇති අසීමිත තොරතුරු සම්භාරය ශක්ති උල්පතක් ලෙස භාවිත කළ හැකි බව, වාරණ මුක්ත කලාපයක් වන බැවින් විප්ලවීය මෙවලමක් ලෙස යොදා ගත හැකි බව, තොරතුරු සංසරණය සඳහා ක්ෂණික වාහකයක් ලෙස උපයෝගී කර ගත හැකි බව යනාදී වශයෙන් ශක්ති ධාරිතාවන් රැසක් වෙයි.

පළමුව මේවා එකිනෙක හඳුනාගත යුතු වෙයි. දෙවනුව මේවා අන්තර්ජාලය තුළ ජගත් මට්ටමින් කෙසේ භාවිත කොට ඇත් ද? දැනට කෙසේ භාවිතවේදැයි යන්න අධ්‍යයනය කළ යුතු ය. මෙම ශක්තීන්, මනා ප්‍රතිඵල ලබාදෙන අයුරින් ලාංකීය වශයෙන් පරිහරණය කෙරෙත් ද යන්න ඉන් පසුව සංසන්දනාත්මකව විමසා බැලිය යුතු වෙයි.

එවිට එය යහපත් ප්‍රවිෂ්ඨයක් වනු ඇත. තාක්ෂණික වශයෙන් අප කොතෙක් හරඹ කරන්නට සමත් ද? එම හරඹයන් විසින් අපව ජාලයේ රඳවා තබා ගන්නේ කවර වූ තලයක ද? මාධ්‍යමය වශයෙන් තොරතුරු මුදා හැරීම සඳහා ඉහත කී තාක්ෂණික මෙවලම් භාවිතාවේදී අපගේ ශිල්පීය නිපුණතාව සාපේක්ෂක වශයෙන් සතුටුදයක මට්ටමක හැසිරේ ද? යනාදිය ඉන්පසු පෙළ ගැසෙන කරුණුයි

මෙම කරුණු දෙස වඩාත් සුපරීක්ෂාවෙන් වඩාත් සැලකිල්ලෙන් අපගේ අධ්‍යයනය කළ හැකි වෙතොත්, ලාංකීය ජාල ක්‍රියාකාරකම් විමසුම සාර්ථක එකක් වනු ඇති අතර, අන්තර්ජාලය තුළ අප කවර දිශානතීන් ඔස්සේ පියමං කළ යුතු ද යන්නට සුදුසු පිළිතුරු ද මතුකර ගැනීමට හැකි වනු ඇත. ❑

**සිරිලාලන විජේසිංහ**